# කහඳව පුරාණ ගල්ලෙන් විහාරය ආශ්‍රිත පුස්කොළ පොත් පිළිබඳ අභිලේඛනාත්මක අධ්‍යයනයක්

පූජ්‍ය මන්දාරම්නුවර සුමංගල හිමි*

කිසියම් සමාජයක් හෝ සංස්කෘතියක් සතු දැනුම් සම්භාරය හා පාරම්පරික ඥානය අනාගත පරපුර සඳහා සම්ප්‍රේෂණය කරනු ලබන්නේ අදාළ සමාජය සතු ලේඛන මාධ්‍යයන් මඟිනි. මේ අනුව වසර දහස් ගණනක් තිස්සේ ශ්‍රී ලාංකීක සමාජය විසින් අත්දැකීමෙන් හා ප්‍රත්‍යක්ෂයෙන් ග්‍රහණය කරගත් සාම්ප්‍රදායික දැනුම එක්තැන් වී ඇති ප්‍රධාන ලේඛන මාධ්‍යය වන පුස්කොළ පොත් ද අයත් වනුයේ අභිලේඛන ගණයටය. තල් පත්‍රය සකස් කර ගැනීමෙන් තනාගත් පුස්කොළ පොත් ලේඛන කලාව වසර දහස් ගණනක් ඔස්සේ ඈත ලංකාවේ මෙන්ම වෙනත් දකුණු ආසියාතික හා අග්නිදිග ආසියානු රටවල ද ප්‍රධාන ලේඛන මාධ්‍යය වශයෙන් පැවතුනි. වළගම්බා රාජ්‍ය සමයට අයත් ගම්පහ දිස්ත්‍රික්කයේ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි කහඳව ගල්ලෙන් රජමහා විහාරය පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත්කමකින් යුතු විහාරස්ථානයක් වන අතර මෙහි සියයට අධික පුස්කොළ ප්‍රමාණයක් ශේෂිතව පැවතීම මෙහි පුරාවිද්‍යාත්මක වටිනාකම තහවුරු කරවන්නකි. මේ අනුව මෙම පුස්කොළ පොත් පිළිබඳව එතරම් අවධානක් යොමු නොවීම මහත් කනගාටුදායක කාරණයක් වන අතර මෙම අධ්‍යයනයෙහි අරමුණ වන්නේ එම පුස්කොළ සංචිතයේ පවත්නා පුරාවිද්‍යාත්මක හා අභිලේඛනාත්මක විටිනාකම තහවුරු කරගැනීමයි. නුවර යුගයේ පමණ සකස් කර ඇති මෙම පොත් සංචිතය දෙස බැලීමේදී මෙහි කතුවරුන්ගේ ප්‍රධාන අරමුණ ත්‍රිපිටකය මතුපරපුරට ආරක්‍ෂා වන පරිදි ලියා තැබීම බව පෙනේ. මෙම පුස්කොළ පොත් ලියා තැබීම උදෙසා විශාල පිරිසක් අනුග්‍රහය දක්වා තිබීම වැදගත් කාරණයකි. මෙහිදී බහුල වශයෙන් දම්සක් පැවතුම් සූත්‍රය ලියා තැබූ පොත් රාශියක් දක්නට ලැබෙන අතර සිංහල, පාලි හා සංස්කෘත යන භාෂාත්‍රයෙන්ම පොත් සැගසී නැතහොත් රුසයුම් වී තිබීම කැපී පෙනේ. විශේෂයෙන් මෙහිදී පොත් සංචිතය දෙස බැලීමේ දී ත්‍රිපිටකය, අටුවා, සන්න, වියරණ, වෛද්‍ය, ඡන්දස් හා අලංකාර යන විෂයයන් පාදක කොට ගෙන පොත් රුසයුම් කර තිබෙනු පෙනේ. සකිය භාවිතා කර ඇති ආකාරය එමෙන්ම ඒ සඳහා අමුද්‍රව්‍ය තෝරා ගෙන ඇති ආකාරය පිළිබඳව හා මෙහි භාවිත කර ඇති කම්බය සඳහා අලංකරණයට යොදා ඇති සිතුවම් හා ඒ සඳහා භාවිත වර්ණ ප්‍රභේදයන් පිළිබඳවත් මෙහිදී විමර්ශණය කිරීමට බලාපොරොත්තු වෙමු. එමෙන්ම අක්‍ෂර යොදා ඇති ආකාරය. ලියූ කතුවරුන්, පූජාකළ පුද්ගලයින්, අයත් වන කාලය, ග්‍රන්ථාරම්භය, පිටු අංකගත කිරීම සඳහා භාවිත ක්‍රමවේදයන්, පත්තිරු රූ සටහන්, එමෙන්ම කතුවරුන්ගේ පොදු ප්‍රාර්ථනයන් ආදිය පිළිබඳවද විමර්ශණාත්මක අධ්‍යයනයක් සිදුකිරීමට මෙමඟින් බලා පොරොත්තු වෙමු. විශේෂයෙන් මෙම පොත් සංචිතයේ පවත්නා අභිලේඛනාත්මක වටිනාකම තහවුරු කිරිම මෙම පර්යේෂණයෙන් අපේක්‍ෂා කරමු.

ප්‍රමුඛ පද- ලේඛන මාධ්‍ය, අභිලේඛණ, පුස්කොළ, පුරාවිද්‍යා

* පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය m.sumangla1992@gmail.com